## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2010.

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

-----

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

-----------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂයවී තිබූ රු.1,044,812,358ක් වු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 ප්‍රකාරව පොදු සංචිතයට ගැලපුම් කළ රු.21,564,581ක් වූ පෙර වර්ෂ වියදම් පිළිබඳව තොරතුරු ශේෂ පත්‍ර සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වු නියැදි පරීකෂණයේදි අනාවරණය වු එකතුව රු.19,181,893ක් වු ගිණුම්කරණ අඩුපාඩු, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2011 අප්‍රේල් 30 දිනැති කළමනාකරණ වාර්තාව මගින යොමු කළ අතර රු.953,560ක් වූ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 13 දින විගණනයට ඉදිරිපත් කල ද, පශ්චාත් උපාධි පීඨයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.18,228,333ක් වූ ප්‍රාග්ධන ආධාර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) **ගිණුම් වලින් අත්හැරීම් හා ගිණුම් වල අඩුවෙන් දැක්වීම්**

(i) සමාලෝචිත වර්ෂයේදී ලැබු පරිත්‍යාගයකන් ඉදිකර දී තිබු පිහිනුම් තටාකයේ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේ දී බාහිර විභාග අංශයේ තිබුණු රු.1,014,385ක ප්‍රකාශන තොගයේ වටිනාකම අත්හැරීම හේතුවෙන් ඉතිරි තොග එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබූ අතර ඒ පිළිබඳ පරීක්ෂා නොකර එම වටිනාකම පොදු සංචිතයෙන් ලියාහැරමටද, කටයුතු කර තිබුණි.

(ඇ) **අනුචිත හෙළිදරව් කිරීම්**

(i) පූර්ව වර්ෂයේ හා සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රධාන ගබඩාවේ භෞතික තොග සමීක්ෂණයේදී පිළිවෙලින් නිරීක්ෂණය වූ රු.1,755,173ක හා රු.1,136,297ක තොග අතිරික්තය වූ රු.2,891,470ක් තොග ගැලපුම් ගිණුමකට මාරුකර තිබුණද, මෙම වෙනසට හේතු හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු.21,584,275ක් වූ වැයනොවූ මූලධන වටිනාකමෙන් ඇස්තමේන්තු ඉක්මවා වියදම් කල රු.11,189,683ක අඩුකර ශේෂ පත්‍රයේ වැයනොවූ මූලධන ශේෂය ලෙස රු.10,394,592ක් දක්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ශේෂපත්‍රයේ දුරස්ථ වැඩසටහන් ලෙස දක්වා තිබූ රු.161,530,617ක ශේෂය තුල මෙහෙයුම් කටයුතු නිමකර තිබූ වැඩසටහන් 30කට අදාල රු.4,964,255ක මුදල විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

මුල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද ගිණුම් 09ක හා ඊට අදාල උපලේඛණ අතර රු.26,497,409ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට හේතු පරීක්ෂාකර නිවැරදි කරමට කටයුතු කර නොතිබුණි.

## 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුල්‍ය ප්‍රකාශන වල වර්ෂ කිහිපයක සිට පැවති විවිධ ණයගැති ශේෂ වල එකතුව රු.1,002,733ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.2,153,056ක් වූ සේවක ණය, වාහන, ආපදා සහ පරිගණක ණය ලෙස මුල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂ වර්ෂ ගණනාවක සිට අය නොවී පැවතුණි.

(ඇ) මුල්‍ය ප්‍රකාශනයන්ගේ විෂයයන් 03ක් යටතේ වූ අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන රු.5,260,552ක් වූ ශේෂ දිගු කාලයක සිට පරිශේෂව පැවතුණද, එම අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීම කෙරෙහි අවධානය යොමුව නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය තුල විවිධ සේවාවන් (ආපන ශාලා, පොත් සාප්පු, ඡායා පිටපත් සේවා) පවත්වාගෙන යනු ලබන පුද්ගලික ආයතන වලින් 2008 වර්ෂයේ සිට 2010 ඔක්තෝබර් දක්වා ජලය හා විදුලිය පරිභෝජනය වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.2,053,649ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අවුරුදු 25ක බදු කාලසීමාවකට පසු විශ්වවිද්‍යාලය වෙත නැවත පැවරීමේ පදනම මත විශ්වවිද්‍යාල භූමියෙන් මහජන බැංකුව වෙත 1998 නොවැම්බර් 02 දින ලබා දී ඇති බිම් කැබැල්ලේ මහජන බැංකුව විසින් ඉදිකර ඇති ගොඩනැගිල්ල සඳහා දෙපාර්ශවය එකඟත්වය මත විශ්වවිද්‍යාලය වෙත අය විය යුතු රු.1,405,000ක බදුකුලී මුදලින් මෙතෙක් අයවී තිබුණේ රු.40,000ක් පමණක් වූ අතර විගණිත දිනය වන (2011 ජනවාරි 17 ) විටත් දෙපාර්ශවය ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයක් ඉදිකිරීමේ කටයුතු වල නියැලුණු ඉංජිනේරුමය කාර්යයන පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් තාවකාලිකව ඉදිකර තිබූ වැඩබිම් කාර්යාලය අදාල කාර්යයන් නිමකල පසද (2008 මැයි ) එය ඉවත් කරගෙන නොතිබුණු අතර 2008 ජනවාරි සිට 2010 සැප්තැම්බර් දක්වා පාවිච්චි කරන ලද විදුලිය හා ජලය වෙනුවෙන් රු.903,739ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි.

(උ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ජායා පිටපත් සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් 2008 සැප්තැම්බර් සිට 2010 අගෝස්තු දක්වා කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු රු.79,806ක හිඟ මුදල් අයකර ගැනීමකින් තොරව 2010 සැප්තැම්බර් සිට නැවත කොන්ත්‍රාත්තුව එම කොන්ත්‍රාත්කරු වෙතම පිරිනමා තිබුණි.

(ඌ) ජාතික තරුණ සේවා සභාවට අයත් කාර්යාල වෙත හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමුපකාර පොත් හල වෙත ණය පදනම මත ශිෂ්‍ය අත්පොත් නිකුත් කර තිබුණු අතර 2009 හා 2010 වර්ෂ තුළ නිකුත් කල ශිෂ්‍ය අත්පොත් 848ක් වෙනුවෙන් ලැබිය යුතු රු.203,680ක මුදලක් විගණන දිනය වන 2010 ජුලි 12 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

පිළවෙලින් රු.17,460,684ක් හා රු.66,873,123ක් වූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් සඳහා වයස් විශ්ලේෂණ සහිත උපලේඛණ විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර ශේෂ තහවුරු කිරීම් ද, කැඳවා නොතිබුණි.

## 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| I. | 29 වන වගන්තියේ (එ) උප වගන්තිය | විශ්වවිද්‍යාලයක සනාතන සභාව විසින් නිර්දේශ කරනු ලැබ ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනැමිය යුතු වුවත් ඉන් බැහැරව ඉතිහාසය හා පුරාවිද්‍යා අංශයේ හේම එල්ලාවල පදනම මඟින් විදේශිකයෙකු වෙත ආචාර්ය උපාධියක් පිරිනමා තිබුණි. |
| II. | 29(උ) වගන්තිය | විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන්ව නොසිටිමින් විශ්වවිද්‍යාලයේ බාහිර විභාගවලින් සාමාර්ථය ලැබූ තැනැත්තන්ට උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රිය විශිෂ්ඨතා, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ප්‍රදානය කිරීම හා පිරිනැමීම කළයුතු වුවත්, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ආරම්භ කර ඇති බාහිර ශිෂ්‍යයින්හට සහභාගි විය හැකි එක් අවුරුදු ස්වයං මූල්‍ය පාඨමාලා 07 සඳහා කොමිෂන් සභාවේ එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |
| III. | 99 වන වගන්තියේ (ඇ) උප වගන්තිය | උසස් අධ්‍යාපන ආයතනයට අයත් වූ කවර ප්‍රභවයකින් හෝ ලැබෙන මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු අතර එම මුදල් පරිපාලනය කිරීම මූල්‍යාධිකාරී සතු වගකීමක් වේ. එහෙත් විශ්වවිද්‍යාල අරමුදලට නොගැනෙන බැංකු ගිණුම් 10ක් ආරම්භ කර ඇති අතර 2010 දෙසැම්බර් 31 දිනට එම ගිණුම් වල ශේෂය රු.මිලියන 89ක් විය. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඈ) | බැංකු ජංගම ගිණුම් 05ක 2010 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර මාස 06ක් කල් ඉක්මවා තිබූ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.2,338,314ක චෙක්පත් 105ක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 8 වන වගන්තිය | ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගත යුතු වුවත් විශ්වවිද්‍යාලය සතු නිල නිවාස සහ කුලී නිවාස 25 න් 11 සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහය | |
| | I. 10 පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | ආචාර්යවරුන් විසින් නිවාඩු ලබාගැනීමේදී නියමිත කාර්ය පටිපාටිය අනුගමනය කර නොතිබූ අතර ලබාගත් නිවාඩු ලේඛනගත කිරීමක්ද සිදුකර නොතිබුණි. |
| | II. 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ආචාර්යවරුන්ද සිය පැමිණීම සනාථ කිරීම සඳහා පැමිණීමේ ලේඛනයක අත්සන් කළ යුතු වුවත් එසේ කටයුතු කර ද නොතිබුණි. |
| | III. 26 පරිච්ඡේදයේ 2.1 | උසස් අධ්‍යාපන ආයතනවල සියලුම භාණ්ඩ හා ස්ථාවර වත්කම් පිළිබඳව සමීක්ෂණ මණ්ඩලයක් විසින් වාර්ෂිකව හරි වැරදි බැලීම් කළ යුතු වුවත් රු.1,127,236,848ක් වටිනා ස්ථාවර වත්කම්, රු.3,273,492ක් වූ උප ගබඩා තොග සහ පුස්තකාල පොත්පත් සම්බන්ධව එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර සමීක්ෂණ මණ්ඩල පත්කර තිබූ රු.1,512,454,184ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |
| (ඉ) | 352 වන පාලක සභා තීරණය | දේපල හා තක්සේරු කළමනාකරණ අධ්‍යයනාංශය විසින් ඉදිරිපත් කළ තක්සේරු වාර්තා අනුව නිවාස කුලිය අයකළ යුතුයැයි ගෙන තිබූ තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඊ) | 2006 ඔක්තෝබර් 09 දින පැවති 06 වන නිවාස කමිටු රැස්වීම් තීරණය | අවුරුදු 03ක කාලය ඉක්මවා කුලී නිවාස වල පදිංචිව සිටින නිලධාරීන් 06දෙනෙකුට ඒවායින් ඉවත්වන ලෙස දින නියම කර තිබුණද, 2011 ජුනි 06 දින වන විටත් නිලධාරීන් නිවාස වලින් ඉවත් වී |

නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1. මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.1,219,962,568ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.1,075,329,651ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.1,165,713,709ක ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.54,248,859ක් දක්වා අඩුවී තිබූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.1,058,856,653ක් වූ රජයේ ප්‍රදානය හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.16,472,998ක් වී තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.37,775,861ක පිරිහීම සඳහා සමස්ත වියදම රු.164,564,622ක වැඩිවීමට අනුරූපව විශ්වවිද්‍යාල ආදායම රු.19,931,704කින් වැඩිවීම බලපා තිබුණි.

### 2.1.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **නේවාසිකාගාර කුළියට ගැනීම**

(i) අංක 2004/ED/HE/63 හා 2004 දෙසැම්බර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.1,050 බැගින් මාසික නේවාසිකාගාර කුලී ගෙවිය යුතු වුවද ඉන් බැහැරව ගෙවීම් කිරීම හේතුවෙන් 2008 සැප්තැම්බර් සට 2011 අගෝස්තු දක්වා වැඩිපුර ගෙවා ඇති මුදල රු.6,079,414ක් විය.

(ii) 2010/2011 වර්ෂය සඳහා එම නේවාසිකාගාරය කුළියට ගැනීම සම්බන්ධ තාක්ෂණ කමිටුව විසින් පරිසර හානි වලක්වා ගැනීම සඳහා නේවාසිකාගාර පරිශ්‍රයේ සිදුකළ යුතු අත්‍යාවශ්‍යය අලුත්වැඩියා සිදුකර ගැනීම සඳහා ගෙවීමට නියමිත කුළියෙන් රු.1,000,000ක මුදල් රඳවා ගැනීමට නිර්දේශ කර තිබුණ ද, 2011 පෙබරවාරි දක්වා එම අළුත්වැඩියාවන් සිදුනොකර මුළු කුළී මුදල නේවාසිකාගාර පාලනාධිකාරිය වෙත ගෙවීම් කර තිබුණි.

(iii) විශ්වවිද්‍යාලය විසින් කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාර පදිංචියට සුදුසු බවට පලාත් පාලන ආයතනවලින් ලබාගත යුතු සහතික ලබාගෙන නොතිබුණි.

(iv) ශිෂ්‍ය නේවාසිකාගාර ලෙස පෞද්ගලික නිවාස කුලියට ගැනීමේදී හා කුලී මුදල වැඩි කිරීමේදී මුදල් රෙගුලාසි 835(2)(ඇ) අනුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වාර්තා ලබාගෙන නොතිබුණි. එමෙන්ම දේපල හා තක්සේරු කළමනාකරණ අධ්‍යයනාංශයේ තක්සේරු කළ කුලිය ද ඉක්මවා කුලී ගෙවීම හේතුවෙන් 2001 සිට 2010 දක්වා රු.627,500ක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) මුදල් රෙගුලාසි 835(3) ප්‍රකාරව බදු කාල සීමාව වෙනුවෙන් ලිඛිත ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් එසේ නොකළ අවස්ථා 06 ක් නිරීක්ෂණය වූ අතර එළඹි බදු ගිවිසුම්ද මාස 08ක කාල ප්‍රමාදයකින් යුතුව අත්සන් කර තිබුණි.

(ආ) **බාහිර විභාග සඳහා ලියාපදිංචි ගාස්තු අයකිරීම හා අනෙකුත් ගෙවීම්**

බාහිර විභාග අංශයේ ලියාපදිංචි ගාස්තු අයකිරීම් හා අදාල අනෙකුත් ගාස්තු ගෙවීම්දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 861 හා 2005 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව නව ගාස්තු අය කිරීම සහ පැවැති ගාස්තු 25% සිට 860% දක්වා පරාසයකින් වැඩි වන ලෙස ගාස්තු සංශෝධනය පාලක සභාව විසින් අනුමත කර තිබුණි.
ඉහත කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාලක සභාව විසින් අංක 364:09(1) දරන තීරණය ගැනීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පරබාහිරව ක්‍රියාකිරීම සඳහා තීරණය කිරීම සභාවේ අධිකාර බලය ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද පොත් පත් හා ලේඛන අනුව විධිමත් ක්‍රමවේදයකින් තොරව පාලක සභාව අනුමත කල අංක 242/22 මුදල් කමිටු පත්‍රිකාව පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා 2009 ඔක්තෝබර් සිට 2010 මැයි දක්වා රු.6,847,815ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) පාලක සභාව ගන්නා ලද තීරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා යැවීමට තීරණය කර ඇතත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.2.1 කාර්ය සාධනය

----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පීඨ 4 හි ශිෂ්‍යයන් 10,465 දෙනෙකු අධ්‍යාපනය ලබා තිබුණ අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වියදම් ලෙස රු.1,429,973,872ක වැය කිරීම හේතුවෙන් ඒක ශිෂ්‍ය පිරිවැය රු.136,643ක් විය.

(ආ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය ආචාර්යවරුන් 464 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණද, ඉන් 61දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ සප්ත වාර්ෂික නිවාඩු හෝ වෙනත් නිවාඩු ලබාගෙන තිබුණි.

### 2.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

රු. මිලියන 70ක් වු විශ්වවිද්‍යාලයේ අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2003 අගෝස්තු 06 වැනි දින අමාත්‍ය මණඩල අනුමැතිය ලැබ් තිබු අතර එම ඉදිකිරීම් කටයුතු 2011 ජුනි 30 වන විටත් ආරම්භකර නොතිබුණි.

### 2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් අංක 842 හා 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය පකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පෞද්ගලික සමාගමක් මගින් පිළියෙල කර ගැනීමට 2005 වර්ෂයේදි රු.1,147,412ක ගෙවා තිබුණද එය සම්මත පරිගණක වැඩසටහන් මගින් සිදුකර නොතිබු බැවින් විශ්වවිද්‍යාලීය අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

(ආ) අංක 08 හා 2006 ජනවාර් 25 දිනැති ප්‍රසම්පාදන කාර්යය පර්පාටියෙහි 4.3.1 හා 4.3.2 වගන්ති ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමකින් හා අනුමත කිරීමකින් තොරව 2010 මාර්තු 31 දින ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණයට දින 20ක් සඳහා යන්ත්‍ර 04ක් (යන්ත්‍ර දින 80ක්) ලබා ගැනීමට හා ප්‍රසම්පාදන අත්පොතෙ 2.14.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ලංසු පටිපාටිය අනුගමනය කිරීමකින් තොරව මිල ගණන් කැඳවා තිබුණි. යන්ත්‍ර දින 249ක් සේවයේ යොදවාගෙන 2011 ජනවාර් 06 දින වන විට රු.4,218,961ක් ගෙවීම් කර තිබුණි. 2010 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි පැවති අන්තර් විශ්වවිද්‍යාල පැසිපන්දු, ටෙනිස හා වොලිබෝල් යන තරඟ පැවැත්වීමේ අරමුණින් මෙම ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණ කටයුතු අරඹා තිබුණද, විධිමත් සැලැස්මක් අනුව කටයුතු නොකිරීම හේතුවෙන් එම අරමුණු ඉටුකර ගත නොහැකි වී තිබුණි.

(ඇ) **බාහර විභාග ඒකකයේ ශිෂ්‍ය අත් පොත් අලෙවි ආදායම්**

(i) ශිෂ්‍ය අත්පොත් භාර ගැනීම හා නිකුත් කිරීම සඳහා මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව ලේඛණ පවත්වා නොතිබුණු අතර පවත්වා තිබු ලේඛණයද අසම්පුර්ණ තත්ත්වයක පැවතුණි.

(ii) 2010 වර්ෂයේ බාහිර උපාධි පාඨමාලා සඳහා (ව්‍යාපාර පර්පාලන උපාධි පාඨමාලාව හැර) ශිෂ්‍ය අත්පොත් පිටපත් 12,000 ක් මුද්‍රණය කර තිබුණද, ශිෂ්‍ය ලියාපදිංචිවීම් වල සාමාන්‍යය 6,000 - 7,000 අතර විය. අවශ්‍යතාවය අනුව මුද්‍රණය නොකිරීම නිසා රු.509,737ක් වටිනා පොත් 6,023ක් ඉතිරි වී තිබු අතර, නැවත ප්‍රයෝජනයට ගත නොහැකි මෙම පොත් සඳහා දරා තිබු වියදම අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

## 2.2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එක් අර්ධවාර්ෂිකයක (Semester) එක් විෂයක් සඳහා සතියට පැය 03 බැගින් සති 15කදී දේශන පැය 45ක් සම්පූර්ණ කළ යුතු වුවද, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ 2010 පෙබරවාරි 22 සිට 2010 ජුනි 11 දක්වා වු දෙවන අර්ධවාර්ෂිකයේ විෂයයන් 26ක් සඳහා වු ශිෂ්‍ය පැමිණීමේ හා දේශන පැවැත්වීමේ සටහන් පරීක්ෂා කිරීමේදී එක් විෂයකවත් නියමිත දේශන පැය ගණන සම්පූර්ණ කර නොතිබුණි. එක් එක් විෂය සඳහා දේශන නොපැවැත් වු පැය ගණන 7 1/2 සිට 43 1/2 ක් දක්වා පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ශාස්ත්‍ර පීඨයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශයේ බාහිර දේශකවරුන්ගේ පැමිණීමේ ලේඛණයේ පැය ගණන හා ගෙවීම් ලේඛනයේ පැය ගණන් වල නොසැසදීම් වු අතර ගෙවීම් වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ශිෂ්‍යයින්ගේ පැමිණීමේ ලේඛන හෝ වෙනත් ලිඛිත සාක්ෂි අධ්‍යයන අංශය සතුව නොතිබුණි.

(ඇ) 2008/2009 ශාස්ත්‍ර පීඨ අධ්‍යයනවාර දින දර්ශනය අනුව පලමු අර්ධ වාර්ෂිකය සඳහා නියමිත පරිදි විභාගය පවත්වා තිබුණද, ප්‍රථිඵල නිකුත් කිරීම නියමිත දිනට සිදු කර නොතිබු අතර එය දින 44 සිට දින 120 ක පරාසයක් දක්වා ප්‍රමාදයක් වී තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශය සඳහා අධ්‍යයන වාර සැලැස්මක් නොතිබු අතර අනුමත සේවක සැලැස්ම අනුව කථිකාචාර්යවරුන් 05ක් හා ඉංග්‍රීසි උපදේශකවරුන් 22 දෙනෙකු ලෙස සේවක මණ්ඩලය 27ක් සිටිය යුතු වුවත් කථිකාචාර්යවරුන් 04 දෙනෙකු හා ඉංග්‍රීසි උපදේශකවරුන් 03දෙනෙකු ලෙස 07දෙනෙකුගෙන් සමන්විත සේවක මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලය සතුව ඉංග්‍රීසී ඉගැන්වීමේ අංශයක් (ELTU) පැවතිය ද, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් එම පීඨයේ සිසුන්ගේ ඉංග්‍රීසී ඉගැන්වීමේ කටයුතු සඳහා ව්‍යාපාර සන්නිවේදන විෂයට ආචාර්යවරුන් දෙදෙනෙකු හා උපදේශකවරයකුගෙන් සමන්විත වූ වෙනම කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබු අතර ඒ සඳහා වු අනුමැතිය හා අධිකාරිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.2.5 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛණයේ අනුමත ප්‍රතිපාදනය ඉක්මවා පොත්පත් හා වාර සඟරා සහ විද්‍යාගාර උපකරණ සඳහා රු.11,286,059ක් වැඩිපුර වියදම් දරා තිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට වරින් වර යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) පාලන ගිණුම්

(ඇ) වාහන පාලනය

(ඈ) සුළු මුදල්

(ඉ) නඩත්තු අංශය සඳහා පිරිවැය ක්‍රමයක් හඳුන්වා දීම

(ඊ) නේවාසිකාගාර පරිපාලනය